IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණය - 2013
## ප්‍රථම සෙමෙස්තරය
(පවත්වන ලද්දේ 2014 සැප්තැම්බර්)

## DY 01 – සිංහල භාෂාව

**විභාග අපේක්ෂකයින්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ. තුනයි. **(03)**

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් **(08)** සහ පිටු දෙකකින් **(02)** සමන්විතවේ.

(4) උත්තර පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම උත්තර පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. පහත දැක්වෙන යෙදුම්වල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i)

i. සුභ මුහුර්ථය
ii. සමස්ථි වාර්තා
iii. ඤාන ගවේෂණය
iv. කනිෂ්ඨ නිලධාරි
v. කුරුළු කැදලි
vi. දර්ශණ නිරික්ෂණය
vii. අත්‍යාවශ්‍ය ගනුදෙනු
viii. දාතම දරන ලේඛණය
ix. නල ළිඳ
x. ලැව් ගිනි මර්දනය
xi. ශ්‍රේනි ප්‍රදානය
xii. විවිද අර්බුද
xiii. ධෛර්යමත් සෙබළු
xiv. ශාකසාර ඖෂධ
xv. අලුත් සිනමා හළ
xvi. ප්‍රබල වසංගාර්ථ
xvii. ගැටලු නිරාකරනය
xviii. ආර්තික ප්‍රතිලාභ
xix. ආශ්වාදජනක සන්දර්ශන
xx. ඇසළ පෙළහර

(ලකුණු 20)

(ආ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. සාහිත්‍ය උලෙලේ ප්‍රධාන තෑගි පිරිනැමුවේ ඇමතිවරයා විසිනි.
ii. අධ්‍යක්ෂ තුමා ගුරුවරියක් මාරු කලේය.
iii. සියලු දේශපාලනඥයින් සත්පුරුෂයන් වෙත්වා.
iv. අප දෙදෙනා ලබන සතියේ දී විදේශගත වෙමු.
v. හිමි නමක් පාරේ පිඬු සිඟා වඩිති.
vi. අස්වනු නෙළීමේදී දේශිය ගොවියා අත්කම් ක්‍රමය උපයෝගි කර ගන්නා ලදී.
vii. හේ මුවින් නොබැණ ඉවසූහ.
viii. ක්‍රීඩකයින් බොහෝ දෙනෙකු අවසාන මහා තරගයට සහභාගි විය.
ix. දේවිකාගේ සිතට පුංචි සතුටක් ගලා ගෙන ආවාය.
x. දෙමාපියෝ දරුවන් හොඳින් ඉගෙන ගනිතියි සිතති.

(ලකුණු 20)

2. "උම්මග්ග ජාතක කතුවරයාගේ එක් අරමුණක් වී ඇත්තේ බමුණන් උපහාසයට ලක් කිරීමයි." සිද්ධි තුනක් ඇසුරෙන් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

3. "ඇතැම් සිද්ධිවල දී ගුත්තිල මෙන්ම මූසිල ක්‍රියා කරන ආකාරය, එවැනි අවස්ථාවලදී වර්තමාන පුද්ගලයින් ක්‍රියා කරන ආකාරයට වෙනස් නොවේ." ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 15)

4. ගුත්තිල කාව්‍යය ලියූ වෑත්තෑවේ හිමියන්ගේ නිරංකුශ කවිත්වය මතුවන අවස්ථා කීපයක් පෙන්වා දෙන්න.

(ලකුණු 15)

5. යශෝරාවය නවකතාවෙහි වර්තමාන සමාජයේ දරුවන් හා දෙමවුපියන්ගේ සබඳතා සුරුකෙන හා බිඳ වැටෙන අයුරු කලාත්මකව ප්‍රකාශ වී ඇද්දැයි විමසන්න.

(ලකුණු 15)

6. "ජී බී සේනානායක මහතා ස්වකීය කෙටිකතා රචනයේදී කතා ක්‍රමය මෙන්ම චෙකෝෆ්ගේ කතා ක්‍රමය භාවිත කරයි." සුදුසු නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

7. "කවියක් රසවත් බවට පත් කරන ප්‍රධාන සාධකය එහි අන්තර්ගත නිර්ව්‍යාජ අනුවිභූතියයි." විමසන්න.

(ලකුණු 15)

8. පහත දැක්වෙන පද්‍ය පන්තියෙහි සාහිත්‍යමය අගය විමසන්න.

**41. පියසේන ඇසූ ප්‍රශ්නයක්**

පසුගිය නත්තල් කාලේ නිවාඩුවෙයි මම ආවේ
පුංචි බේබි එක්කල පාසැල් යන්නයි මෙහි ආවේ

හතේ අටේ චක්කරයෙන් ගණන් හදා සමත් වෙලා
පොත් තියෙන කතා කියා පාඩම් දී සමත් වෙලා

ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා
ගමේ ඉඳන් ආවේ මම දෙකෙන් තුනට සමත් වෙලා

බේබිගෙ අත අල්ලාගෙන උදේට පාසැල් යනවා
බේබිගෙ අත අල්ලාගෙන හවසට ගෙදරට එනවා

බේබිගෙ පන්තිය අයිනේ ගල් බැම්මේ වාඩි වෙන්නෙ
බේබිලාට කියන කතා එතන ඉඳන් අහන් ඉන්නෙ

හවසට අත්වැල් බැඳගෙන කවි කියන්නෙ අපි දෙන්නා
ගැමුණු කුමරුගේ කතාව ඉගෙන ගන්නෙ අපි දෙන්නා

එහෙම උණත් මා නොදන්න දෙයක් තියෙනවා අහන්න
දන්න කෙනෙක් හොයා බලා මට මේ ගැන කියා දෙන්න

තුනේ ඉඳපු පුංචි බේබි හතරේ පන්තියට ගිහින්
තුනේ ඉඳපු මම හතරට යන්නේ කවදාද ඉතින්?

-මොනිකා රුවන්පතිරණ

(ලකුණු 15)